# අනුරාධපුර යුගයේ දානශාලාවන්හි ශිලා ඔරු නිර්මාණ තාක්ෂණය හා භාවිතය

පී.ඩී.එම්.ආර්.කේ.එල්. බණ්ඩාර[1], වී.එන්.එස්. උපේක්ෂා[2], ටී.එන්. සඳමාලි[3]

අනුරාධපුර යුගයේ දානශාලාවේ දැකගත හැකි සුවිශේෂ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණයක් ලෙස ශිලා ඔරු හැඳින්විය හැකිය. මහාවිහාරය, අභයගිරිය, මිරිසවැටිය, ජේතවනය යන පැරණි විහාරස්ථානවල දානශාලා පරිශ්‍ර ආශ්‍රිතව ශිලා ඔරු පිහිටා තිබේ. විද්වත්හු පවසන අකාරයට මෙම ශිලා ඔරු භික්ෂූන් වහන්සේලාගේ දානය ගබඩා කිරීමට භාවිත කර ඇත. විශේෂයෙන් බත්ඔරු යනුවෙන් සාමාන්‍ය ව්‍යවහාරයේ පවතින්නේ එබැවිනි. ප්‍රමාණාත්මකව ගත්කළ ශිලා ඔරු දෙ ආකාරයකින් දැකිය හැකි අතර එනම් බත් හා කැඳ ඔරු ලෙසය. මෙම ශිලා ඔරු නිර්මාණයේ දී විවිධ ක්‍රමවේද භාවිත කර ඇත. එසේම එය භාවිත කිරීමේ දී නිශ්චිත ක්‍රමවේදයක් මූලාශ්‍රය ආශ්‍රයෙන් ඉදිරිපත්ව නොමැති බැවින් පවතින පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අධ්‍යයනයෙන් අනුරාධපුර යුගයේ ශිලා ඔරු නිර්මාණ තාක්ෂණය හා එහි භාවිතය පිළිබඳ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ අධ්‍යයනය කිරීමට අපේක්ෂා කෙරේ. මේ සඳහා සාහිත්‍ය මූලාශ්‍රය, සම්මුඛ සාකච්ඡා, ක්ෂේත්‍ර අධ්‍යයනය තුළින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී. ශිලා ඔරු පිළිබඳව දීර්ඝ ලෙස පර්යේෂණ පැවැත් වූ රෝලන්ඩ් සිල්වා මෙම ඔරු අතරෙන් විශාල ප්‍රමාණයේ ඔරු බත් දැමීම සඳහා භාවිත කළ හෙයින් ''බත්ඔරු'' ලෙසත් කුඩා ඔරු ව්‍යංජන, කැඳ ආදිය දැමීමට භාවිත කළ හෙයින් ''කැඳ ඔරු''ලෙසත් හඳුන්වා ඇත. බත්ඔරුවල නිර්මාණ තාක්ෂණය ගත්කළ ඒවා ගල් පුවරු එකිනෙකට වද්දා ගල් පුවරුවල දෙපසම හොඳින් ඔප දමා තිබේ. මෙම ශිලාමය බත්ඔරු තුළ වියළි ආහාර ද්‍රව්‍යය තැන්පත් කර ඒවා තුළින් භික්ෂූන්ට දානය ලබා ගැනීමට සැලසු බව ටී.ජී. කුලතුංගගේ මතය වේ. විනය පිටකය අනුව භික්ෂූන්ට වියළි සළාක ලබා දෙන්නේ නම් පිසින ලද ආහාර ප්‍රමාණයෙන් 1/4ක් ලබාදිය යුතු බවත්, විශාල ශිලා ඔරුව ''බත් නැව'' ලෙසත් මිහින්තලය, අභයගිරිය වැනි දානශාලා ''බත්ගේ'' ලෙසත් හඳුන්වා ඇත. අභයගිරිය දානශාලාව කැණීමේ දී එහි මුළුතැන්ගෙය තුළින් උඳුන් පෙළක් හමුවීම අනුව මෙම ඔරු තුළට පිසූ ආහාර බහාලන්නට ඇති බවට නිගමනය කළ හැකිය. මේ පිළිබඳව අදහස් දක්වා ඇති රෝලන්ඩ් සිල්වා බත්ඔරුවකින් ආහාර ලබාගත් භික්ෂු සංඛ්‍යාව පිළිබඳව උපකල්පනය කර කැඳ, ව්‍යංජන ඔරු පිළිබඳව ද සිය පර්යේෂණ තුළ අවධානයට බඳුන් කර ඇත. ඒ අනුව බත්ඔරුවට සාපේක්ෂව කැඳ ඔරුවේ ධාරිතාවය සපේක්ෂ වශයෙන් 10% සිට 27% දක්වා පරාසයකට විහිදෙන අනුපාතයක පවතින බව පෙන්වා දී තිබීම තුළින් මෙහි භාවිතය පිළිබඳ යම් අදහසක් ඇතිකර ගැනීමට ද හැකි වී තිබේ.

**ප්‍රමුඛ පද** : ශිලා ඔරු, බත් ඔරු, කැඳ ඔරු, දානශාලා,

---

[1] ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය.*kusallakshanbandara1@gmail.com*

[2 3] පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, *sunaliupeksha1@gmail.com*